# වැව හා බැඳුණු සාම්ප්‍රදායික ජීවන වෘත්තීන් ග්‍රාමීය ජන පැවැත්මට සිදු කරන බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (නවගිරියාව වැව් ගම්මානය ආශ්‍රයෙන්)

**ගුණවර්ධන ඩී.ඒ.එම්.පී.**[1]

අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ නවගිරියාව ග්‍රාමයේ ගැමියන් කුඩා වැව් ආශ්‍රිත ව සිය ජීවනෝපාය සකසා ගනිමින් සිට ජීවිකාව ගෙන යයි. ග්‍රාමීය ජනයා තම පැවැත්ම සාර්ථක කර ගැනීමට මූලික අඩිතාලම වැවෙන් සලසා ගැනුනේ ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ ගැටලුව වේ. ඒ අනුව අධ්‍යයනයේ අරමුණ වන්නේ වැව හා සම්බන්ධ වූවා වූ සාම්ප්‍රදායික ව කාලාන්තරයක් පුරා පවත්වාගෙන ආ වෘත්තීන් කොතෙක් පුද්ගල ජීවිතයට බද්ධ ව පැවතියේ ද යන්නයි. මේ සඳහා සම්මුඛ සාකච්ඡා මෙන් ම ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලදී. එලෙස ප්‍රදේශයේ පවත්නා ජීවන වෘත්තීන් අතර ප්‍රධානතම තැනක් ගන්නේ කෘෂිකර්මාන්තය යි. කෙත් යායන්වල යල  මහ දෙකන්නයේහි ගොවිතැන් කිරීම උදෙසා ජලය ලබා දීමත් ඒ ඔස්සේ ජීවන පැවැත්ම අතීතයේ සිට ශක්තිමත් වූ බවත් හඳුනාගත හැකි ය. එමෙන් ම අතීතයේ සිට පැවතියා වූ කුලයන් අතුරින් වෙල්ලාල කුලයෙහි වෘත්තිමය කාර්යය මැනවින් කිරීමට ඔවුන් වැව් මංකඩක් වූ රදා මංකඩ භාවිතයට ගෙන ඇත. එහි දී අතීතයේ සිට තම පැවැත්ම උදෙසා වෙනත් කුලයන්හි රෙදි සේදීම කළ මොවුන්ට වේතන ලෙස එදිනෙදා අවශ්‍ය භාණ්ඩ ලබා දුන් බව සඳහන් ය. තවද වැව් ඉහත්තාවේ එක් කොටසකින් කුඹල් කර්මාන්තය කරන පිරිස් විසින් මැටි ලබා ගනි.  එමෙන් ම වැව් ආශ්‍රිත පන්වලින් පැදුරු, කුළු, මල් වට්ටි, බුලත් දමන කුර පයිය වැනි දෑ නිර්මාණය කිරීමත් ඒ සමඟ අතීත සංස්කෘතිකාංගයන් වැව ඔස්සේ විද්‍යාමාන වීමට ඒ ආශ්‍රිත සැරසිලි මෝස්තර නිර්මාණයෙන් පිළිබිඹු වේ. තවද  ආගමික ස්ථානවල ද වෙළඳාම් කටයුතුවල දී වැවෙන් ලබා ගන්නා නෙළුම්, මානෙල්, ඕලු, කුමුදු වැනි මල් වර්ග යොදා ගනී. ඒ තුළින් ද තම ජීවන පැවැත්ම තහවුරු වේ. තවද ධීවර කර්මාන්තය අතීත සමාජයේ සිට ම ග්‍රාමීය ජනයා විසින් තම ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම ද සිදු කළේය. ඉකිරිය වැනි ඖෂධ පැළෑටි ද හුණු නිශ්පාදනයට යොදා ගන්නා කුඹුක් වැනි ශාක ද ජීවන වෘත්තිය සවිමත් කර ගැනීමට මහගු පිටිවහලක් ග්‍රාමීය වාපි සංස්කෘතියෙන් සපයයි. වෙල් විදානේවරු හා වැව් රාජකාරී සිදු කරන ගම් ප්‍රධානීන්ගේ සිට වැව් පදනම් කරගෙන තම ජීවන පැවැත්ම සාර්ථක කර ගැනීමට දායක වන ගම්වාසීන් සම්ප්‍රදායික ලෙස වැවේ පෝෂක කලාපය භාවිත කොට ගන්ගොඩ නිර්මාණය කරමින් ජීවත් වූ බව මෙම සාධක තුළින් මනාව පෙනී යයි.

**ප්‍රමුඛ පද :** වැව, සාම්ප්‍රදායික, වෘත්තීන්, ග්‍රාමීය, ජීවන පැවැත්ම

---

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
pereramaduwanthi615@gmail.com